# නිවේදනය යි!

1980 අංක 33 දරණ **පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරීවරුන්** (Authorized Officers) **සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරීවරුන්** (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) **වෙත:**

**Mr. Radiator COOLANT නමින් ග්ලයිෆොසේට් වල්නාශක නිෂ්පාදනයක් ඇසුරුම් කර බෙදා හැරීම හා අලෙවි කිරීම.**

පොදුවේ කෘෂිකාර්මික කටයුතු සඳහා ග්ලයිෆොසේට් නිෂ්පාදන භාවිතය සීමාකරමින් තේ සහ රබර් වගාව සඳහා පමණක් සීමිත තත්ත්ව යටතේ ග්ලයිෆොසේට් ආනයනය කර නිකුත් කිරීම සම්බන්ධයෙන් අංක PS/CP/20/2018 හා 2018.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක 18/0925/801/004 හා 2018.05.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබ 2018 සැප්තැම්බර් මස සිට ආරම්භ වන මාස 36ක කාලයක් සඳහා නීත්‍යානුකූලව ග්ලයිෆොසේට් ආනයනය කිරීම, බෙදා හැරීම හා භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරීමේ වගකීම පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇත.

තවද, 2019.01.01 දාතමින් චක්‍රලේඛ අංක RP/AUO/2019-1 මඟින් 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතට අනුව නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද ග්ලයිෆොසේට් සංයෝජනවලට පරිබාහිර නිෂ්පාදන සහ භාවිතාවන් සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් තොරතුරු නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සහ සුපරීක්ෂාකාරීව කටයුතු කළ යුතුය.

මේ අතර, පළිබෝධනාශක අලෙවි ක්ෂේත්‍රයේ සමහර පුද්ගල කණ්ඩායම් විසින් නීති විරෝධී ග්ලයිෆොසේට් සංයෝජන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සිදුකරමින් පවතින බව මූලික පරීක්ෂණවල දී අනාවරණය කර ගෙන ඇත. නීති විරෝධී ග්ලයිෆොසේට් සංයෝජන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සම්බන්ධයෙන් ඉතා අභියෝගාත්මක සංසිද්ධීන් අතර, **Mr. Radiator COOLANT නමින් ග්ලයිෆොසේට් වල්නාශක නිෂ්පාදනයක් ඇසුරුම් කර බෙදා හැරීම හා අලෙවි කිරීම** සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ඇඹිලිපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ දී මදනායක කැලුම් මදුශංක යන අයෙකු 2020.12.09 වන දින වරදකරුවෙකු කරන ලදුව නීත්‍යානුකූල දඬුවම නියම කරන ලදී.

අනුමත කරන ලද ග්ලයිෆොසේට් සංයෝජන පිළිබඳ තොරතුරු අඩංගු ලැයිස්තුව www.doa.gov.lk දරන වෙබ් අඩවියට ප්‍රවේශවීමෙන් හෝ 2018.09.13 දින අංක 2088/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය, www.documents.gov.lk මඟින් හෝ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කර ඇති වලංගු බලපත්‍ර පරීක්ෂා කිරීම මඟින් හෝ දැනගත හැකි ය.

ප්‍රධාන වශයෙන් ඇඹිලිපිටිය ප්‍රදේශයෙන් හමු වී ඇති මේ සමඟ දැක්වෙන **Mr. Radiator COOLANT නමින් ඇසුරුම් කර ඇති ග්ලයිෆොසේට් අඩංගු නීතිවිරෝධී** නිෂ්පාදනය (ඇමුණුම -1) පිළිබඳව පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරීවරුන් හා නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ සියළුම බලයලත් නිලධාරීවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 දෙසැම්බර් මස 16 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 Mobile 0772363824




**ඇමුණුම -1:** Mr. Radiator COOLANT නමින් ඇසුරුම් කර ඇති ග්ලයිෆොසේට් අඩංගු නීතිවිරෝධී නිෂ්පාදනය